# කච්චතිව් දූපත් සිතියම නාවික හමුදාව හදයි

නයන තරංග ගමගේ

ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් කච්චතිව් දූපත ආවරණය වන පරිදි සකස් කරන ලද ප්‍රථම නාවික සිතියම එළිදක්වා ඇත. නාවික හමුදා වෙබ් අඩවිය වාර්තා කරන ආකාරයට නාවික හමුදාවේ ජල මානක විද්‍යා අංශය විසින් නිර්මාණය කළ මෙම සිතියම පසුගිය 09 වැනිදා නාවික හමුදාපති වයිස් අද්මිරාල් සිරිමෙවන් රණසිංහ මහතා වෙත අදාළ ජල මානක විද්‍යා අංශයේ ප්‍රධානි රියර් අද්මිරාල් සිසිර ජයකොඩි මහතා විසින් පිරිනමා ඇත.

සාගර කලාපයේ වැදගත් නාවික කේන්ද්‍රස්ථානයක් බවට පත්වීමට ප්‍රයත්න දරන ශ්‍රී ලංකාව වැනි රටකට ජල මානක විද්‍යාවේ දියුණුව ඉතා වැදගත් කරුණක් බව නාවික හමුදාව පවසයි. නාවික කටයුතුවල ආරක්ෂාව, සමුද්‍රීය පරිසරය ආරක්ෂා කිරීම, ජාතික යටිතල පහසුකම් සංවර්ධනය, වෙළෙඳ කලාපය කළමනාකරණය, සමුද්‍රීය ගවේෂණය, සමුද්‍රීය සම්පත් සුරැකීම, මුහුදු සීමා මායිම් නිර්ණය කිරීම සහ වෙරළ බඩ ආපදා කළමනාකරණය යන පුළුල් විෂයයන් රැසක් ජලමානක විද්‍යාවට අයත් වන බවද නාවික හමුදාව සඳහන් කරයි.

ඒ අනුව ජල මානක විද්‍යාවේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා ජල මානක විද්‍යා අංශය විසින් සම්පාදනය කළ ප්‍රථම නාවික සිතියම අතිශය වැදගත් බව නාවික හමුදාව වැඩිදුරටත් සඳහන් කරයි.